factum

CFLI/FCIL
Canada Fund for Local Initiatives
Fonds canadien d'initiatives locales

MITIGATING ADVERSE IMPACTS CAUSED BY LAWS AFFECTING ONLINE/DIGITAL PUBLICATIONS/ ONLINE CONTENT

මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන නීති මගින් සිදුවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා

இணைய வெளியீடுகளுக்கு பாதகம் விளைவிக்கும் சட்டங்களால் ஏற்படும் தீங்கான தாக்கங்களை குறைப்பதற்கான

# Policy Report Recommendations

# ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව

# கொள்கை பரிந்துரைகள் அறிக்கை

**26th February 2026**

Colombo, Sri Lanka

factum

CFLI/FCIL
Canada Fund for Local Initiatives
Fonds canadien d'initiatives locales

නිර්දේශ

## මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන නීති මගින් සිදුවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා

# ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව

**26th February 2026**
Colombo, Sri Lanka

# මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන නීති මගින් සිදුවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව

## 1. විධායක සාරාංශය

මාර්ගගත මාධ්‍ය කරගනිමින් සිදුකරන පළකිරීම් විශේෂයෙන්ම සමාජ මාධ්‍ය සහ වෙබ් අඩවි මගින් සමාජය වෙත විශාල බලපෑමක් සිදුකරනු ලැබේ. එබැවින් මාර්ගගත මාධ්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විශාල සමාජ අවධානයක් යොමුවී ඇත. ශ්‍රී ලංකාව තුල පවතින ඇතැම් නීතිමය ප්‍රතිපාදනවල පවතින නිශ්චිත නොවන බව හේතුවෙන් මෙන්ම නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන්ගේ පක්ෂපාතීත්වය හෝ නොසැලකිලිමත්බව හේතුවෙන් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් සහ වෙබ් අඩවි කතුවරුන් නීතිමය වශයෙන් අපහසුතාවයන්ට පත්වූ අවස්ථා රැසක් වාර්තා විය. එසේම සමාජ මාධ්‍යතුල සිදුකරන නොසැලකිලිමත් සහ අසත්භාවයෙන් යුතු පළකිරීම් මගින් විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බවද වාර්තාවී ඇත . මෙම පිරිස අතර කාන්තාවන්, ළමුන්, සුළුතර ආගමික සහ වාර්ගික ප්‍රජාවන් මෙන්ම LGBTQ කණ්ඩායම්වලට සිදුවන හානිය ඉතා දැඩිය. එබැවින් මාර්ගගත පළකිරීම් සිදුකරන පාර්ශවයන්ට සිදුවන නීතිමය බාධාවන් ඉවත් කිරීම හෝ අවම කිරීම මෙන්ම, මාර්ගගත ප්‍රකාශන මගින් පුද්ගලයන්ට සිදුවන හානිය අවම කිරීම සඳහා ද නීතිමය ප්‍රතිපාදන සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවයක් මතු වී ඇත. කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වූ CFLI ව්‍යාපෘතිය යටතේ FACTUM ආයතනය විසින් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් වෙබ් අඩවි ක්‍රියාකාරීන් අන්තර්ගත නිර්මාණකරුවන් මෙන්ම ආන්තික ප්‍රජාවන්ගේ නියෝජිතයන් අරමුණු කරගෙන පවත්වන ලද සංවාද කිහිපයකදී මේ පිළිබඳව සංවාදය මතුකරන ලද අතර එම අදහස් සහ ශ්‍රී ලංකාව තුල පවතින නීතිමය ප්‍රතිපාදන අධ්‍යයනය කිරීම තුලින් ලබාගත් තොරතුරු පදනම් කරගෙන මාර්ගගත පළකිරීම් හා සම්බන්ධ පාර්ශවයන් ගේ අවධානය /භාවිතය සඳහා FACTUM ආයතනය මෙම ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාව සකස් කර ඇත.

මාර්ගගත පළකිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින නීති, මාර්ගගත පළකිරීම් සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපාන නීතිමය ප්‍රතිපාදන, නීතිය ක්‍රියාත්මක වීමේදී මාර්ගගත පළකිරීම් සිදුකරන පාර්ශවයන්ට සිදුවන අහිතකර බලපෑම්, මාර්ගගත ප්‍රකාශන මගින් පුද්ගලයන්ට සිදුවන අහිතකර බලපෑම් යන ක්ෂේත්‍රයන් පිළිබඳව මෙහිදී අවධානය යොමුකර ඇති අතර, ඒ ඔස්සේ එම දෙපාර්ශයටම සිදුවන බලපෑම් අවම කිරීම සඳහා පාර්ශවකරුවන්ට ගත හැකි පියවර පිළිබඳ නිර්දේශ/යෝජනා මෙම ප්‍රතිපත්ති නිර්දේශ වාර්තාවේ ඇතුලත් වේ.

## 2. ශ්‍රී ලංකාවේ මාර්ගගත පළකිරීම් හා සැබැඳි නීති

වෙබ් අඩවි, සමාජ මාධ්‍ය ඇතුලු මාර්ගගත මාධ්‍ය හා සම්බන්ධයෙන් නීති රැසක් බලපානු ලැබේ. එම නීති සියල්ල ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ වර්ගීකරණය කල හැකිය. එනම්,

- මූලික අයිතිවාසිකම් නීති ක්ෂේත්‍රය
- නියාමන නීති ක්ෂේත්‍රය

- අපරාධ නීති ක්ෂේත්‍රය
- බුද්ධිමය දේපළ නීති ක්ෂේත්‍රය
- ජාතික ආරක්ෂක නීති ක්ෂේත්‍රය
- මැතිවරණ නීති ක්ෂේත්‍රය

### 2.1. මූලික අයිතිවාසිකම් නීති ක්ෂේත්‍රය-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සදහන් මූලික අයිතිවාසිකම් 3ක් සෘජුවම මාර්ගගත පළකිරීම් හා සම්බන්ධ වේ. එනම් 14(1)(අ) ව්‍යවස්ථාවේ සදහන් වන "අදහස් පළකිරීම ඇතුලු භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස", 14(1)(උ) ව්‍යවස්ථාවේ සදහන් වන "නීත්‍යානුකුල රැකියාවක නියැලීමේ අයිතිය" සහ 14(අ) ව්‍යවස්ථාවේ සදහන් වන "තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය" යන මූලික අයිතිවාසිකම් වේ. මාර්ගගත පළකිරීම් සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මතුවන බොහෝ ගැටලුවලදී සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ට මෙන්ම අන්තර්ගතයන් නිර්මාණය කරන පුද්ගලයන්ටද මෙම මූලික අයිතිවාසිකම් මගින් සිය වෘත්තීය හා ක්‍රියාකාරකම් ඉදිරියට කරගෙන යාම සඳහා රැකවරණයක් සපයයි. මින් පසුව සාකච්ඡා කරන මාර්ගගත මාධ්‍යයට බලපාන නීතිමය ක්ෂේත්‍රවලදී විධායක හෝ පරිපාලන ක්‍රියාකාරකමක් මගින් අසාධාරණයකට ලක්වූ විට මෙම මූලික අයිතිකම් පාදක කරගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරීම හෝ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් සිදුකර සාධාරණය ඉටුකරගත හැකිය.

### 2.2. නියාමන නීති ක්ෂේත්‍රය-

මාර්ගගත මාධ්‍ය පළකිරීම් නියාමනය සඳහා පවතින ප්‍රධානතම නීතිය වන්නේ 2024 අංක 9 දරණ මාර්ගගත සුරක්ෂිතභාවය පිළිබඳ පනතවේ.
එයට, කෙටුම්පත් අවස්ථාවේදී සිටම විශාල විරෝධයක් ගොඩනැගී තිබිණි. කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව දිවයිනේ ප්‍රමුඛ පෙළේ නීතිඥයින්ගෙන් සමන්විත නීතිඥ සාමූහිකය විසින් 2023 සැප්තැම්බර් 22 වන දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් මෙම කෙටුම්පත හෙළා දකින ලදී. එසේම සිවිල් සංවිධාන සහ මාධ්‍ය ක්‍රියාකාරීන්ගෙන් සහ වෘත්තීය සමිතිවලින් සමන්විත වූ "පීඩාකාරී නීතින්ට එරෙහි මාධ්‍ය සිවිල් සංවිධාන සහ වෘත්තීය සමිති එකමුතුව"ද මෙම පනත් කෙටුම්පත හෙළා දකින ලදී. මාධ්‍ය සංවිධාන සියල්ලම මෙම පනත් කෙටුම්පත ගෙන ඒමෙන් වලකින ලෙස රජයට බලපෑම් සිදුකරන ලදී. ශ්‍රී ලංකා නීතිඥ සංගමයද 2023 සැප්තැම්බර් 23 දින පැවති නීතිඥ සංගම් කාරක සභාවේදී රජය මෙම පනත් කෙටුම්පත ඉල්ලා අස්කරගත යුතු බවට බලකිරීමේ යෝජනාවක් ඒකමතිකව සම්මත කරගන්නා ලදී.[1]
පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව උපයෝගීකරගනිමින් පුද්ගලයන් සහ සංවිධාන විසින් මෙම කෙටුම්පතේ ව්‍යවස්ථානුකුලභාවය ප්‍රශ්ණකරමින් පෙත්සම් 47ක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනුකරන ලදී. ඒ අනුව කෙටුම්පතේ බොහෝ වගන්ති සංශෝධනයට ලක්වුවද පැවති විරෝධතා හේතුවෙන් පනත සම්මත වූ

---

[1] https://english.theleader.lk/news/5967-basl-calls-for-immediate-withdrawal-of-anti-terrorism-bill-and-online-safety-bill 17-03-2024

වහාම නැවත සංශෝධනයන් සිදුකරන බවට විෂය භාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලදී. [2]

මාර්ගතතව සිදුකරන සියලුම ප්‍රකාශන නියාමනය කිරීම මෙම පනත මගින් සිදුකරනු ලැබේ. මෙම පනත මගින් ඩිජිටල් මාධ්‍ය පළකිරීම් සම්බන්ධව සිදුකරන මූලිකම බලපෑම වන්නේ මාර්ගගතව සිදුකිරීම තහනම් පළකිරීම් හඳුන්වාදීමය. පනතේ 12 සිට 22 දක්වා  වගන්තිවල සඳහන් තහනම් පළකිරීම් මාර්ගගතව සිදුකිරීම පනත මගින් තහනම් කර තිබේ. එම පළකිරීම් මගින් අගතියට පත් පුද්ගලයකුට ලබාගත හැකි සහන ක්‍රියාමාර්ග 3ක් පනත තුල දක්වා ඇත. එනම් එම තහනම් පළකිරීම් (12 වගන්තියේ සිට 22 වන වගන්තිය දක්වා වන) හේතුවෙන් අගතියට පත් පුද්ගලයාට මාර්ගගත සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවට පැමිණිලි කිරීම මගින් එම කොමිසම විසින් පවත්වන පරීක්ෂණයක් මගින් එකී පළකිරීම් ඉවත් කිරීමේ නියෝගයක් ලබාගැනීම, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා එකී පළකිරීම ඉවත් කිරීම සඳහා කොන්දේසි සහිත ආඥාවක් ලබාගැනීම සහ අදාල පළකිරීමට එරෙහිව සිවිල් නඩුවක් පැවරීම සඳහා පළකිරීම සිදුකල පුද්ගලයා නිවැරදිව හඳුනාගත නොහැකි නම් සේවා සපයන්නා වගඋත්තරකරු දිසා අධිකරණයේ පවරන නඩුවක් මගින් අදාල පළකිරීම සිදුකල පුද්ගලයාගේ අනන්‍යතාවය හෙළිකරන ලෙස සේවා සපයන්නා වෙත නියෝගයක් ලබාගැනීම, එයට අමතරව කොමිෂන් සභාවට පැමිණිල්ලක් නොමැතිව උවද නඩු පැවරීමට බලයක් පවතින අතර තහනම් පළකිරීම් සම්බන්ධව දඩ නියම කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය ලැබී ඇත. එසේම මෙම පනත මගින් ප්‍රතිපාදන සලසා ඇති තවත් එක් බලපෑම් සහගත කරුණක් වන්නේ මාර්ගගත ස්ථාන ලියාපදිංචි කිරීම සඳහා කොමිෂන් සභාව වෙත බලතල පවරා තිබීමයි. එයට අමතරව තහනම් ප්‍රකාශන සිදුකරන මාර්ගගත ස්ථාන ප්‍රකාශයට පත් කිරීම සඳහා කොමිසමට බලය පැවරෙන අතර එම ප්‍රකාශිත මාර්ගගත ස්ථානයක් වෙත අනුග්‍රහ දැක්වීම හෝ එමගින් අනුග්‍රහයක් ලබාගැනීම වරදක් ලෙස දක්වා ඇත. එයට අමතරව මාර්ගගත ප්‍රකාශ සඳහා ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීමේ බලතලද කොමිෂන් සභාවට පවරා ඇත. මෙම පනත මේ වන විට අර්ධ වශයෙන් ක්‍රියාත්මක වන නීතියක් බවට පත්ව තිබේ. පනත යටතේ රීති හෝ නියෝග මෙතෙක් පනවා නොමැති අතර කොමිෂන් සභාවද පත් කර නොමැත. එසේම පනත සංශෝධනය කිරීම සඳහා මහජන අදහස් ලබාගැනීම අධිකරණ අමාත්‍යංශය විසින් සිදුකර ඇත.

මාර්ගගත මාධ්‍යයට අදාල වන අනෙක් නියාමන නීතිය වන්නේ 1996 අංක 27 දරණ සංශෝධනයෙන් සංශෝධිත 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතයි. මාර්ගගත මාධ්‍යය පළකිරීමට අදාලවන අන්තර්ජාල සේවා සැපයීම් සඳහා විද්‍යුත් තරංග වෙන් කිරීම සහ නියාමනය සිදුකරනු ලබන්නේ මෙම පනත යටතේ වන අතර ඒ සඳහා පනත මගින් විදුලි සංදේශ නියාමනය කොමිෂන් සභාව ස්ථාපනය කර ඇත, නමුත් මෙම කොමිෂන් සභාව මාර්ගගත පළකිරීම්වල අන්තර්ගතය නියාමනය නොකරයි.

[2] 298 පිටුව 2024-04-24 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හැන්සාර්ඩ් වාර්තාව

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සම්මත වී ඇති නමුත් මාධ්‍ය භාවිතයට බලපෑමක් ඇති කරන ප්‍රතිපාදන බලාත්මක වීම සඳහා නියෝග නිකුත් වී නැති බැවින් මේ අවස්ථාව වන විට මෙම පනතේ බලපෑමක් නොමැත.

### 2.3. මාර්ගගත පළකිරීම් සඳහා බලපාන අපරාධ නීති,

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අපරාධ නීතියට අදාල අණපනත් කිහිපයකම ප්‍රතිපාදන මාර්ගගත පළකිරීම් සම්බන්ධයෙන් අදාල වේ. එනම්,

**2.3.1. දණ්ඩ නීති සංග්‍රහය-** දණ්ඩ නීති සංග්‍රහයේ 120, 286, 286(අ), 291(අ), 291(ආ), 345, 365(ඇ), 402,403,486 වගන්ති මාර්ගගත ප්‍රකාශණයන්ට සෘජුවම අදාල වේ.

**2.3.2. අසභ්‍ය ප්‍රකාශන පනත-** පනතේ 2වන වගන්තිය යටතේ අසභ්‍ය ප්‍රකාශනයන් බෙදාහැරීම තහනම් කර ඇත.

**2.3.3. ළමා සහ යෞවන (හානිකර ප්‍රකාශන) පනත** - ළමයකු හෝ යෞවනයකු අතට පත්වීමෙන් ඔහු හෝ ඇය දූෂ්‍යයට ලක්වන ආකාරයේ දෙයක් ප්‍රචාරය කිරීම තහනම් කර තිබේ.

**2.3.4. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුති පනත** - පනතේ 3(1) වගන්තියට ගැනෙන යුද්ධය පැතිරවීම හෝ ආගමික හෝ වාර්ගික වෛරය පැතිරවීම තහනම් කර ඇත.

**2.3.5. පරිගණක අපරාධ පනත** - පනතේ 6 වන වගන්තිය මගින් ජාතික ආරක්ෂාවට හෝ ආර්ථිකයට අගතිදායක ලෙස යමක් ප්‍රචාරය කිරීම වළක්වා ඇත.

**2.3.6. ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වැළැක්වීමේ පනත-** පනත යටතේ නඩු පවරා ඇති පාර්ශවයන් හෙළිදරව් වන ආකාරයේ මාධ්‍ය වාර්ථා පලකිරීම තහනම් කර තිබේ.

**2.3.7. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත** - පනතේ 6 වගන්තිය මගින් මුදල් විශුද්ධිකරණය පිළිබඳව සිදුකරන විමර්ෂණයක සැකකරුවන්ගේ අනන්‍යතාවය මාධ්‍ය මගින් ප්‍රචාරය නොකල යුතු බව දක්වා ඇත.

### 2.4. මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන ජාතික ආරක්ෂක නීති

ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන ජාතික ආරක්ෂක නීති කිහිපයක් මාර්ගගත ප්‍රකාශයන් සම්බන්ධයෙන් බලපෑමක් ඇති කරයි. එනම්,

**2.4.1. මහජන ආරක්ෂක ආඥා පනත -**

මහජන ආරක්ෂක පනත යටතේ හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවකදී නිකුත් කරනු ලබන හදිසි අවස්ථා නියෝග මගින් ජනමාධ්‍ය සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන සීමාවන්ට යටත්ව අන්තර්ජාල මාධ්‍ය පළකිරීම් සිදුකල යුතුය.

**2.4.2. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත -**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2වන වගන්තියේ වරදක් වන පළකිරීමක් හෝ පනත යටතේ ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කර ඇති නියෝගයක් උල්ලංඝනය වන පරිදි අන්තර්ජාල මාධ්‍යයක යම් පළකිරීමක් සිදු කිරීම වරදකි.

**2.4.3. රාජ්‍ය නිල රහස් පනත -**

රාජ්‍ය නිල රහස් පනත යටතේ සීමිත ප්‍රදේශ ලෙස ගැසට් කර ඇති ස්ථානවල ඡායාරූප පළකිරීම හෝ ආරක්ෂක මෙහෙයුම් පිළිබඳව රහස්‍ය තොරතුරු පළකිරීම වරදක් බව පනතේ සඳහන් වේ.

**2.5. මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන බුද්ධිමය දේපල නීතිය,**

- 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත-

බුද්ධිමය දේපල පනතේ 6 වන වගන්තියේ දක්වන්නේ මෙම පනත යටතේ ආරක්ෂිත කෘති ලෙස සැලකෙන කෘතියක කතුවරයාගෙන් හෝ නිර්මාණ ශිල්පියාගෙන් ලබාගත් නිසි අවසරයකින් තොරව එම කෘතියක් හෝ ඉන් සැලකිය යුතු කොටසක් පළකිරීම ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීමකි.

**2.6. මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන අපහාස නීති,**

අපහාස නීති යටතේ ප්‍රධාන කරුණු 3ක් පිළිබඳව ප්‍රවේසම් විය යුතුය. එනම්,

**2.6.1. අධිකරණයට අපහාස කිරීම -** මේ යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදන සහ 2024 අංක 8 දරන අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පිළිබඳ පනත යටතේ පවතින ප්‍රතිපාදන පිළිබඳව මාර්ගගත ප්‍රකාශකයන් සැලකිලිමත් විය යුතුය.

**2.6.2. පාර්ලිමේන්තු වරප්‍රසාද,-** 1953 අංක 21 දරණ පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත යටතේ පාර්ලිමේන්තුවට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට අපහාසයක් වන පළකිරීමක් සිදුකිරීම අපරාධ වරදක් ලෙස හඳුනාගෙන ඇත.

**2.6.3. සිවිල් අපහාසය හෙවත් පුද්ගල අපහාසය -** යම් ප්‍රාකශනයක් මගින් පුද්ගලයකුගේ කීර්ති නාමයට හානියක් සිදුවුවහොත් එම අදාල ප්‍රකාශය පල කල පුද්ගලයාගෙන් වන්දි ඉල්ලා සිවිල් නඩුවක් පැවරීමේ අයිතිය පවතී. එම නිසා කරුණුවල සත්‍යතාව පිළිබඳව දැඩි ලෙස සැලකිලිමත් විය යුතුය.

**2.7. මාර්ගගත ප්‍රකාශන කෙරෙහි බලපාන මැතිවරණ නීති**

**2.7.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයෙහි ලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙනයන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ) (5) ව්‍යවස්ථාව- (5) (අ) ව්‍යවස්ථාව දක්වා ඇත. ඒ අනුව මැතිවරණ සමයේදී මැතිවරණ

කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන මාධ්‍ය උපමාන පිළිබඳව දැනුවත් වීමක් ඒ අනුව කටයුතු කිරීමත් අවශ්‍ය වේ.

### 2.7.2. මැතිවරණ පනත්

පාර්ලිමේන්තු මැතිවරණ පනත, ජනාධිපතිවරණ පනත, පළාත් සභා ඡන්ද විමසීම් පනත, සහ පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත යන පනත් තුල පවතින පොදු විධිවිධාන වන්නේ යම් අපේක්ෂකයකුට හානියක් වන ආකාරයේ අසත්‍ය වාර්තා පළකිරීම මෙන්ම අයුතු බලපෑමක් වන ආකාරයේ පළකිරීමක් සිදු කිරීම මැතිවරණ වරදක් ලෙස හඳුනාගෙන තිබීමයි. එබැවින් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී මැතිවරණ ප්‍රතිඵලය ප්‍රකාශ කරන අවස්ථාව දක්වා වූ කාල පරිච්ඡේදය තුලදී එවැනි පළ කිරීම්වලින් වැලකිය යුතුය.

## 3. මාර්ගගත පළකිරීම් සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපාන නීතිමය ප්‍රතිපාදන

### 3.1. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳව පනත-

මෙම පනත මගින් දක්වා ඇති තහනම් ප්‍රකාශ සම්බන්ධව වැරදි නිශ්චිත නොවන අතර පුළුල් අර්ථ ලබාදිය හැකි බැවින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට අනවශ්‍ය සීමාවක් පනවයි. තහනම් ප්‍රකාශ යන වරද ඉතා පුළුල් අර්ථ නිරූපනයකට ඉඩකඩ සලසා ඇති බැවින් මාර්ගගතව නිර්මාණාත්මක සංනිවේදනයේ යෙදෙන නිර්මාණකරුවන් විසින් පකරනු ලබන පළකිරීම් වලට එරෙහිව කොමිෂන් සභාවේ විධාන නිකුත් වීමේ ඉහල සම්භාවිතාවක් පවතී. විශේෂයෙන්ම යම් ප්‍රකාශයක් අසත්‍යද නැද්ද යන්න නිශ්චය කිරීමේ පවතින බැරෑරුම් බව හේතුවෙන් සද්භාවයෙන් සිදුකරන පළ කිරීම්වලට එරෙහිවද නීතිමය පියවර ගැනීම හේතුවෙන් අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථා දැඩි ලෙස සීමා වී යයි. එසේම පනත යටතේ පත් කිරීමට නියමිත ස්වාධීන නොවන කොමිෂන් සභාවක් විසින් පනතේ තහනම් කර ඇති ප්‍රකාශන සම්බන්ධව විනිශ්චයක් ගෙන එකී ප්‍රකාශන නවත්වන ලෙස ප්‍රකාශ පළකරන්නන්ට දැනුම්දීම මගින් නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය අභියෝගයට ලක්වේ. එසේම එම ස්වාධීන නොවන කොමිෂන් සභාවක විධාන නිකුත් කිරීම් හමුවේ විශේෂයෙන්ම සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් බියපත් කිරීමේ හැකියාවක් පවතී. ස්වාධීන නොවන කොමිෂන් සභාවක් මගින් ගනු ලබන තීරණ දේශපාලනික විය හැකි බැවින් පුරවැසියන්ගේ නිදහස් අදහස් ප්‍රකාශ කිරීමට බාධාකාරී වේ. එමෙන්ම සමාජ මාධ්‍ය වේදිකා ලියාපදිංචි කල යුතු බව සඳහන් වන බැවින් එකී කොන්දේසියට අවනත නොවන සමාජ මාධ්‍ය වේදිකාවන්, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම මගින් පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවන් අහිමි වීමේ අවධානමක් පවතී.

එසේම අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ සමාජ මාධ්‍ය වේදිකාවන්ට මෙම පනත යටතේ අපරාධ වගකීම් පැවරෙන බැවින් එම තත්වයන් හමුවේ එකී සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැරවීම මගින් සමාජ මාධ්‍ය තුල සිදුකරන අදහස් පළකිරීම් සීමාවීමේ (බොහෝවිට සම්පූර්ණයෙන්ම නතරවීමේ ) අවධානමක් පවතී. අන්තර්ජාල සේවා සපයන සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැර වුවහොත් මාර්ගගතව වෙළඳ ප්‍රචාරක සහ භාණ්ඩ වෙළඳාමේ යෙදී සිටින පුද්ගලයන්ට විශාල අගතියක් සිදුවේ.

කෙසේ නමුත් පනතට එක් කිරීමට නියමිත වූ සංශෝධන තවමත් ඉදිරිපත් කර නොමැත. එසේම පනත යටතේ නිකුත් කිරීමට නියමිත රීති හෝ නියෝගයන්ද නිකුත් කර නොමැත. එසේම කොමිෂන් සභාවද පත් කර නොමැත. ඒ අනුව මේ වන විට පනත යටතේ සිදුවන බලපෑම වන්නේ අන්තර්ජාල මාධ්‍ය ඔස්සේ සිදුකරනු ලබන පළකිරීම් ඉවත් කරවා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ ඉදිරියේ පුද්ගලික මට්ටමින් සිදුකරනු ලබන නඩු පැවරීමය (පනතේ 24(2) වගන්තිය යටතේ ) .

මෙම නඩු පැවරීම් මගින් අන්තර්ජාල ප්‍රකාශන විශේෂයෙන්ම සමාජ මාධ්‍ය මගින් තමන්ට අගතිදායකව සිදුකරන පළකිරීමක් ඉක්මනින් ඉවත් කරවාගැනීමට අවස්ථාවක් පැමිණිලිකරුවන්ට ලැබේ. මේ සම්බන්ධව ඇතැම් සමාජ මාධ්‍ය ක්‍රියාකරුවන්ගේ අදහස වන්නේ පනතේ ප්‍රතිපාදන අනුව යමින් යම් යුක්ති සහගත සහ මහජන උන්නතියකට අදාල පළකිරීම් ඉවත් කිරීම මෙන්ම එවැනි ක්‍රියාකාරීන් අධෛර්ය කිරීමක්ද මෙමගින් සිදුවන බවයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2026-02-03 දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කලේ " අධිකරණ අමාත්‍යංශය විසින් මාර්ගගත ආරක්ෂණ පනත වෙනුවට සුදුසු නීති සම්පාදන විධිවිධාන සමග නව පනතක් ප්‍රතිස්ථාපනය කරන තෙක්, එහි භාවිතය අත්හිටුවීමක් ප්‍රකාශයට පත් කළ යුතුය." යනුවෙනි.[3]

### 3.2. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පනත -

2007 අංක 56 දරණ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පනතේ 3(1) වගන්තියේ දක්වෙන්නේ "කිසිම තැනැත්තකු විසින්, යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු කිරීම සංයුක්ත වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පෙළඹවීම්, නොකළ යුතුය" බවයි. මෙම වගන්තිය උපයෝගී කරගනිමින් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් රැසක් පසුගිය වසර කිහිපය තුල අත් අඩංගුවට ගෙන ඇත. මෙම අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් පවරණ ලද මූලික අයිතිවාසිකම් නඩු වලදී සහ ඇප නියෝගවලදී අධිකරණය දක්වා සිටියේ ඇතැම් අත්අඩංගුවට ගැනීම් අත්තනෝමතිකව සිදුකර ඇති බවයි. මෙම වගන්තිය උපයෝගී කරගෙන පොලිසිය විසින් අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම් සිදුකරන නිසා 2019 වසරේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිසියට ඒ පිළිබඳව මාර්ගෝපදේශ නිකත් කරන ලදී[4].

### 3.3. පරිගණක අපරාධ පනත

2007 අංක 24 දරණ පරිගණකය අපරාධ පනතේ 6(1) වගන්තියේ දක්වෙන්නේ යම් පරිගණකයක් භාවිතා කරමින් ජාතික ආරක්ෂාවට ජාතික ආර්ථිකයට හෝ මහජන ආරක්ෂාවට හානියක් සිදුවන ක්‍රියාවක් සිදුකිරීම වරදක් වන බවයි. මෙම වරද යටතේද සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් මෙන්ම වෙබ් ක්‍රියාකාරීන්ද අත් අඩංගුවට ගෙන ඇත. මෙම වගන්තිය යටතේ පුද්ගලයන් අත්අඩංගුවට ගැනිමේදී

[3] https://www.hrcsl.lk/wp-content/uploads/2026/02/HRCSL-Statement-on-the-Freedom-of-Expression-and-Online-Safety-in-Sri-Lanka_English_03_02_2026.pdf (14-02-2026)
[4] https://www.hrcsl.lk/documentation/guidelines-and-directives/ (14-02-2026)

ඔවුන් භාවිතා කල පරිගණකය සහ සුහුරු දුරකථනද අත්අඩංගුවට ගන්නා අතර ඒවා නඩු භාණ්ඩ ලෙස තබාගන්නා බැවින් පුද්ගලයන් ඇප මත නිදහස් වුවද එම උපකරණ සහ උපකරණ තුල ගබඩාවී ඇති දත්ත නොමැති වීම හේතුවෙන් තම රැකියාව කරගෙන යාම දුෂ්කර වී ඇත. මේ තත්තවය වැළැක්වීම සඳහා පනතේ 21 වන වගන්තියේ ප්‍රතිපාදන සලසා ඇති අතර පනතේ 21(2) වගන්තිය දක්වන්නේ " යම් පොලිස් නිලධරයකු තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සහ කුසලතාවත් දරන බවට සහ එහෙයින් එවැනි කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රවීණත්වය ලබා ඇති බවට පොලිස්පතිවරයා විසින් ලිඛිතව සහතික කරනු ලැබ ඇත්නම් මිස, කිසිදු පොලිස් නිලධරයකු මෙම පනත යටතේ වන විමර්ශන කාර්යය සඳහා යම් පරිගණකයකට ප්‍රවේශ නොවිය යුතුය යනුවෙන් දැක්වේ. නමුත් පොලිසිය විසින් පරිගනක සහ ජංගම දුරකථන පරීක්‍ෂා කිරීමේදී මෙම වගන්තිය කෙරෙහි සැලකිල්ලක් දක්වන බවක් නොපෙනේ'

### 3.4. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන ) පනත

1978 අංක 40 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 2 වන්ගන්තිය ඉතා පුළුල් ලෙස අර්ථ නිරූපනය කල හැකි වගන්තියක් වන අතර එම වගන්තිය යටතේද සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් අත් අඩංගුවට ගෙන ඇත. මෙම පනත යටතේ අත්අඩංගුවට ගත් අවස්ථාවකදී අධිකරණය වෙත ඉදිරිපත් නොකර ආරක්‍ෂක අමාත්‍යවරයාගේ රැදවුම් නියෝග මත පුද්ගලයකු වසරක කාලයක් රදවා තබාගත හැකිය. එබැවින් ඩිජිටල් මාධ්‍ය ක්‍රියාකාරීන්ට මෙම 2වන වගන්තියේ ක්‍රියාකාරීත්වය ඉතාමත් අහිතකරය.

### 3.5. දණ්ඩ නීති සංග්‍රහය

දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය යටතේද වෙබ් අඩවි අන්තර්ගතයන් නිර්මාණකරුවන් සහ සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ව අත් අඩංගුවට ගනු ලැබේ. 120 වගන්තියේ දැක්වෙන්නේ ආණ්ඩුවට විරුද්ධත්වය ඇවිස්සීම වරදක් වන බවයි. නමුත් එහි පැහැදිලි කිරීම්වල දක්වන්නේ යුක්තිය විසඳීම හෝ වැරදි හෝ දෝෂ නිවැරදි කිරීම සඳහා සිදුකරනු ලබන පෙළඹවීම් මේ යටතේ වරදක් නොවන බවයි.

### 3.6. මහජන ආරක්‍ෂක ආඥා පනත

මහජන ආරක්‍ෂක ආඥා පනත යටතේ හදිසි අවස්ථාවක් පවතින විටදී ජනාධිපතිවරයාට නියෝග පැනවිය හැකිය. එම හදිසි අවස්ථා නියෝග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ)(1) ව්‍යවස්ථාවේ දැක්වෙන භාෂණය ඇතුලු අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමාවන ආකාරයෙන්ද පැනවිය හැකි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) ව්‍යවස්ථාවේ දැක්වේ. මෙම අවස්ථාව වන විටද හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කර ඇති බැවින් 2025 නොවැම්බර් මස 28 වැනිදා අංක 2464/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රය 2025 නොවැම්බර් මස 28 වැනිදා අංක 2464/3 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2025 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග බලාත්මක වේ.
එහි 18 සහ 20 නියෝගයන් යම් ආකාරයකට මාර්ගගත ප්‍රකාශයන් සීමා කිරීමක් වන්නේය. නමුත් මේ යටතේ කිසිම අන්තර්ජාල ප්‍රකාශකයකු අත් අඩංගුවට ගැනීමක් සිදුකල බවක් වාර්තා වී නොමැත.

.

### 3.7. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත

2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් පෞද්ගලික දත්ත සැකසීම යන අර්ථ නිරූපණයට පුද්ගලික තොරතුරු මාර්ගගත මගින් බෙදාහැරීමද ඇතුලත් වන බැවින්එයට දත්තදායකයාගේ කැමැත්ත අවශ්‍ය වීම මගින් මාර්ගගත මගින් අන්තර්ගතයන් බෙදාහරින්න්ට සීමාවන් පැනවේ. කෙසේ නමුත් මෙම පනත පූර්ණ වශයෙන් දැනට ක්‍රියාත්මක නොවන නිසා සහ රීති සහ නියෝග තවමත් නිකුත් කර නොමැති නිසා මෙම පනතේ බලපෑම තවමත් මාර්ගගත පළකිරීම් සඳහා අදාල නොවේ.

## 4. නීතිය ක්‍රියාත්මක කිරීම මගින් සිදුවන අහිතකර බලපෑම්

### 4.1. අනීතික අත් අඩංගුවට ගැනීම්

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පනතේ 3(1) වගන්තිය උල්ලංඝනය කල බවට චෝදනා නගමින් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් අත් අඩංගුවට ගැනීම් වාර්තාවී ඇත. බොහෝ දෙනෙක් නීතිපතිවරයා විසින් නඩු නොපවරණ බවට ගරු මහේස්ත්‍රාත් අධිකරණවලට දැනුම්දීමෙන් අනතුරුව මුදාහැර ඇත. ඇතැම් පුද්ගලයන් මෙම අනීතික අත් අඩංගුවට ගැනීම්වලට එරෙහිම මූලික අයිතිවාසිකම් පෙත්සම් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ නඩු පැවරීම් සිදුකර ඇත.

### 4.2. ප්‍රශ්න කිරීම් සහ පොලිසියට කැඳවීම්

සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ව සහ වෙබ් කතුවරුන් ඇතැම් පළකිරීම් සම්බන්ධයෙන් ප්‍රකාශ ලබාගැනීම ද සඳහා පොලිසිය විසින් කැඳවීම් සිදුකිරීම් දක්නට ලැබෙන අතර එම කැඳවීම් වලදී කුමන කරුණක් සම්බන්ධයෙන් කැඳවීම සිදුකරන්නේද යන්න පොලිසිය විසින් නිසි පැහැදිලි කිරීමක් සිදු නොකරන බවක් පෙනී යයි. මේ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් 2025-07-02 හා RTM-101, CRTM-01 දරණ චක්‍රලේඛණය සියලු පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත යොමුකර ඇති නමුත් එයට පටහැනිව කටයුතු කිරීම් දක්නට ලැබේ.

### 4.3. සාපරාධි අපහාසය පිළිබඳව චෝදනා නැගීම

සමාජ මාධ්‍ය පළකිරීම් මගින් හෝ ප්‍රවෘත්ති වෙබ් අඩවියක පළකිරීමක් මගින් තමන්ට අපහාසයක් වී යැයි දේශපාලනඥයන් සහ ප්‍රසිද්ධ පුද්ගලයන් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වෙනත් පොලිස් ස්ථානවලට සිදුකරන පැමිණිලි මත පොලිසිය විසින් අදාල ක්‍රියාකාරීන්ට පොලිසියට කැඳවීම් සිදුකරනු ලැබේ. සාපරාධි අපහාසය නැමති වරද (00) දණ්ඩ නීති සංග්‍රහයෙන් ඉවත් කිරීම 2002 අංක 12 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත මගින් සිදුකර තිබෙන පසුබිමක තවදුටත් අපහාස යන්න සිවිල් නඩු නිමිත්තක් මිස අපරාධ වරදක් නොවන තත්තවයක් තුලද පොලිසියේ මෙම ක්‍රියාකාරීත්වය නිසා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් සහ වෙබ් අඩවි කතුවරුන් දැඩි අපහසුතාවයකට පත්වේ.

මෙම තත්තවය නවත්වන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2026-02-03 දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් රජයෙන් ඉල්ලීමක් කර ඇත.[5]

### 4.4. බොරු නඩු පැවරීම්

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත යටතේ 23 වන වගන්තියේ පවතින පුළුල් බව හේතුවෙන් මහජනතාවට වැදගත්වන තොරතුරු හෙළිදරව්කරන සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් සහ වෙබ් කතුවරුන්ට එරෙහිවද කොන්දේසි සහිත අධිකරණ ආඥා ලබාගැනීම් දක්නට ලැබේ මෙම තත්තවය මාර්ගගත මගින් අදහස් ප්‍රකාශ කරන්නන් අධෛර්යයට පත් කරන කරුණක් වී තිබේ.

### 4.5. පරිගණක අත්අඩංගුවට ගැනීමේදී සිදුවන අවිධිමත්භාවයන්

පරිගණක අපරාධ පනත යටතේ අපරාධයක් පිළිබඳව විමර්ශනය කිරිමේ බලය ඇත්තේ පොලිස්පතිවරයා විසින් ඒ පිළිබඳව පුහුණුවක් ඇති බවට සහතික කල නිලධාරියකු විසින් බවට පනතේ 21 වගන්තියේ දක්වෙන නමුත් ප්‍රායෝගික තත්වය එසේ නොවේ. එමෙන්ම එම පනත යටතේ පරිගණක හෝ ජංගම දුරකතන අත් අඩංගුවට ගැනීමේදී පනතේ දක්වෙන සීමාවන් සහ දත්ත ආරක්ෂාව පිළිබඳව විධිවිධාන අනුගමනය නොකරන බැවින් අත්අඩංගුවට පත්වන සමාජමාධ්‍ය ක්‍රියාකාරීන් සහ වෙබ් අඩවිවල කතුවරුන් විශාල දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ.

## 5. මාර්ගගත පළකිරීම් මගින් පුද්ගලයන්ට සිදුවන අසාධාරණකම්

### 5.1. අසත්‍ය පළකිරීම් මගින් නොමග යැවීම්

මාර්ගගත පළකිරීම් විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුල සිදුකරන අසත්‍ය තොරතුරු පළකිරීම් සහ බෙදාහැරීම් මගින් එම බොහෝ දෙනෙකු නොමග යැවීමක් සිදුවන අතර, ඇතැම් අවස්ථාවලදී යම් යම් පුද්ගලයන් ගේ කීර්තිනාමයට සහ චරිතයට අදාලව අසත්‍ය තොරතුරු බෙදා හැරීම් මගින් එම පුද්ලගයන් මෙන්ම ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ද විශාල වශයෙන් අපහසුතාවයට පත් වේ. අනෙකුත් මාධ්‍ය මෙන් නොව මාර්ගගත හරහා සිදුකරන මාධ්‍යවල පවතින ආවේනික ලක්ෂණ හේතුවෙන් ම අසත්‍ය තොරතුරු ඉතා වේගයෙන් සමාජගත වීම හේතුවෙන් ඉතා කෙටිකාලයක් තුල විශාල හානියක් සිදුවේ. විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින් සම්බන්ධයෙන් මෙම තත්තවය වඩාත් හානිකර ලෙස බලපානු ලැබේ.

### 5.2. වෛරී ප්‍රකාශන

ආගමික සහ ජනවාර්ගික කණ්ඩායම්, දේශපාලන කණ්ඩායම්වල අනුගාමිකයන් මෙන්ම LGBTQ ප්‍රජාවන්ද අරමුණු කරගෙන වෛරී ප්‍රකාශන සමාජ මාධ්‍ය ඔස්සේ පළකිරීම් දක්නට ලැබේ. එමගින් එම පුද්ගලයන් විශාල වශයෙන් සමාජය තුල අපහසුතාවයන්ට පත්වනු දක්නට ලැබේ.

[5] https://www.hrcsl.lk/wp-content/uploads/2026/02/HRCSL-Statement-on-the-Freedom-of-Expression-and-Online-Safety-in-Sri-Lanka_English_03_02_2026.pdf (14-02-2026)

### 5.3. යම් පුද්ගලයන්ගේ අතිශය පුද්ගලික කරුණු පළකිරීම් මගින් අපහසුතාවයට පත් කිරිම

යම් යම් පුද්ගලයන්ගේ අතිශය පුද්ගලික තොරතුරු, ඡයාරූප, වීඩියෝ සහ දත්ත වැනි පුද්ගලිකත්වය කෙලෙසන ආකාරයෙන් සමාජ මාධ්‍ය තුල පළකිරීම් දක්නට ලැබේ. එමගින් එම පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය බරපතල ලෙස අභියෝගයට ලක්වේ.

### 5.4. කප්පම් ඉල්ලීම්

අතිශය පුද්ගලික තොරතුරු සමාජ මාධ්‍යවල පලකරන බවට තර්ජනය කර එසේ නොකිරීමට නම් මුදල් සහ වෙනත් ඉල්ලීම් සිදුකරන පුද්ගලයන් පිළිබඳව වාර්තා වී තිබේ.

## 6. මාර්ගගත ප්‍රකාශන සම්බන්ධයෙන් පවතින නීතිමය ගැටලු අවම කිරිම සඳහා නිර්දේශ

මාර්ගගත ප්‍රකාශන සම්බන්ධයෙන් පළකිරීම් සිදුකරන පාර්ශවයන්ට මෙන්ම එම පළකිරීම් මගින් වින්දිත භාවයට පත් වන පාර්ශවයන්ට සිදුවන ගැටලුකාරී තත්වය අවම කිරීම සඳහා කටයුතු කිරීමේ වගකීමක් ඒ හා බැඳුනු සෑම පාර්ශවයකටම පවතී. මෙහිදී රජය, මාර්ගගත මාධ්‍ය පරිශීලකයින්, මාධ්‍ය සංවිධාන, සමාජ මාධ්‍ය වේදිකාවන් සහ අන්තර්ජාල සේවා සපයන්නන් යන කණ්ඩායම් පාර්ශවකරුවන් ලෙස හඳුනාගත හැකිය, ඒ අනුව මාර්ගගත ප්‍රකාශන සම්බන්ධයෙන් පවතින නීතිමය ගැටලු අවම කිරිම සඳහා එක් පාර්ශවයන්ට පහත ක්‍රියාමාර්ග ගතහැකිය.

### 6.1. මාර්ගගත ප්‍රකාශන සම්බන්ධයෙන් පවතින නිතිමය ගැටලු විසඳිමට රජයට ගත හැකි ක්‍රියාකමාර්ග

**6.1.1. මාර්ගගත සුරක්ෂිතභාවය පිළිබඳව පනත සංශෝධනය කිරීම** - පනතේ 12 සිට 22 දක්වා වගන්තිවල පවතින පුළුල් බව අඩුකර වඩාත් නිශ්චිතවන පරිදි එම වගන්ති සංශෝධනය කිරිම, මාර්ගගත සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව වඩාත් ස්වාධින ආයතනයක් බවට පත් කිරීම සහ එහි වගවීම ප්‍රවර්ධනය වන ආකාරයේ සංශෝධනයන් සිදුකිරීම.

**6.1.2. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය** - පනතේ 2වන වගනතියේ පවතින පුළුල් බව හේතුවෙන් මාර්ගගත මගින් සිදුකරන ප්‍රකාශනයන් සම්බන්ධයෙන් බාධාකාරීවන බැවින් එම වගන්තිය සංශෝධනය කිරීම.

**6.1.3. අන්තනෝමතික අත්අඩංගුවට ගැනීම් වැළැක්වීම සඳහා පොලිසිය මෙහෙයවීම-** මාර්ගගත මාධ්‍යයෙන් සිදුකරන පළකිරීම් සම්බන්ධයෙන් අන්තනෝමතක ලෙස අත් අඩංගුවට පත් වීම් බොහෝ විට සිදුවන්නේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පනතේ 3(1) වගන්තිය උල්ලංඝනය කිරීම, දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය උල්ලංඝනය කිරිම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2 වගන්තිය උල්ලංඝනය කිරීම යටතේය. එබැවින් ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදී ඇති මගපෙන්වීම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලබාදී ඇති මාර්ගෝපදේශ අනුගමනය කිරීම සඳහා සියලු පොලිස් නිලධාරීන් මෙහෙයවීම.

**6.1.4. අපහාසය අපරාධ වරදක් නොවන බව පොලිසිය විසින් පිළිගැනීම-** මාර්ගගත මාධ්‍යයේ සිදුකරන පළකිරීම් සම්බන්ධයෙන් තමන්ට අපහාසයක් සිදුවීම් ඇති බවට සහ ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන ලෙසට සිදුකරන පැමිණිලි පොලිසිය විසින් භාර නොගැනීම.

සමාජ මාධ්‍ය මගින් සිදුකරන පුරවැසියන්ට අහිතකර වන්නා වූ ප්‍රකාශයන් පළවීම වැළැක්වීම/පළකිරීම් කඩිනමින් ඉවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකාවන් සමග නීතිමය වශයෙන් බැඳීමක් ඇතිකර ගැනීම.

**6.1.5.** සමාජ මාධ්‍යය ඇතුලුව මාර්ගගත මාධ්‍ය සඳහා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම සඳහා මූලිකත්වය ගැනීම.

**6.1.6.** සත්‍යාපනය සහ කරුණු පිරික්සිම සිදුකරනු ලබන කණ්ඩායම් දිරිගැන්වීම සහ පිලිගැනිමක් ලබාදීම.

**6.1.7.** ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (CERT) ආයතනයේ විෂය පථය මාර්ගගත පළකිරීම් මගින් අගතියට පත්වන්නන්ට සහය දීම සඳහා මැදිහත් විය හැකි ආකාරයට පුළුල් කිරීම සහ ආයතනය සවිබල ගැන්වීම

## 6.2. මාර්ගගත ප්‍රකාශන සම්බන්ධයෙන් පවතින නිතිමය ගැටලු විසදිමට මාධ්‍යවේදීන් ඇතුලු මාර්ගගත පරිශිලකයන් ට ගත හැකි පියවර

**6.2.1.** අචාරධර්ම පද්ධතියක් ගොඩනගා ගැනීම

**6.2.2.** නිවැරදිභාවය පිළිබඳ සැලකිලිමත්වීම

**6.2.3.** ද්වේශ සහගත ප්‍රකාශන වලින් මිදීම

**6.2.4.** මාර්ගගත සාක්ෂරතාව වර්ධනය කරගැනීම

**6.2.5.** විචාරාත්මක චින්තනය දියුණු කරගැනීම

**6.2.6.** නීතිමය දැනුම වර්ධනය කරගැනිම

**6.2.7.** ජාලගත වීම

**6.2.8.** නියමිත නීතිමය පියවරගැනීම

## 6.3. මාර්ගගත ප්‍රකාශණ සම්බන්ධයෙන් පවතින නිතිමය ගැටලු විසදී මට සමාජ මාධ්‍ය වේදිකාවන්ට කල හැකි දේ

**6.3.1.** ප්‍රජා සම්මතයන් යලි සලකා බැලීම

**6.3.2.** ප්‍රජා සම්මතයන් කඩකිරීම් සම්බන්ධව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වීම

**6.3.3.** රජය සමග නීතිමය වගවීමක් ඇතිකරගැනීම